

# ජය අති මනරම්..! රටම උදාරම්..!

ශ්‍රීලංකා වාසීන් එකාවන්ව සැණකෙළි ස්වරූපයෙන් වීදි බැස ස්වාධීන අදීන රාජ්‍යයක පුරවැසියන් වූවේ යයි හැඟීම් බරව සතුටු වූ අවස්ථා හතරක් ඇත. මෙයි- න් අවස්ථා දෙකක් රජ කාලයේ දී ද, අනෙක් අවස්ථාව මෑත කාලයේ දී ද සිදුවීය. ගජබා රජු සොළී රටට ගොස් යුදවැද, ලාංකික සිරකරුවන් මුදවාගෙන යළි පැමිණි දිනයත්, දුටුගැමුණු මහ රජතුමා එළාර රජු පරාජය කොට ශ්‍රීලංකාව එකසේසත් කළ දිනයත් එලෙස රජ කාලයේ අපරට සියළු දෙනා සතුට අත්විඳි දිනයන් බව පැවසේ.

මෑත කාලයේදී 1948 පෙබරවාරි මස 4 වෙනි දින ශ්‍රීලංකාව බ්‍රිතාන්‍යය වෙතින් නිදහස ලැබූ දිනයේත්, 1972 මැයි 22 වෙනි දින ශ්‍රීලංකාව සියළු විදේශීය අධිරාජ්‍යවාදී බැඳීම් අත්හැර ජනරජයක් බවට පත්වූ දිනයේත්, නිවහල් ජාතියක් හැටියට ශ්‍රී ලංකාවාසීහු උදාර හැඟීම් සහිතව සතුටු වූහ. රජ කාලයේ සිදුවූ අසිරිය පිළිබඳව අත්විඳි අය නැති නිසාත්, ඒවා ලේඛනගතවී නැති නිසාත් ඒ ගැන අනුමාන ලෙස පමණක් සිතාගන්නට හැකිය.

1948 සහ 1972 දි අත්විඳි අසිරිමත් සැණකෙළි ස්වරූපය තරමක වෙනසක් වූයේ එදා රජය මගින් එකතු කළ රාජ්‍ය උත්සව නිසාය. ඒ හැම අවස්ථා වකටම වඩා ශ්‍රීලංකාවාසීන් අනුදැනුමක් හෝ පිටි වහලක් හෝ නැතිවම සිය කැමැත්තෙන්ම වීදි බැස සතුටු වූයේ 2009 මැයි 19, 20, 21, 22 යන දිනයන්හි දී ය. එසේ වූයේ 1975 සිට වසර 34 ක කාලයක් තිස්සේ අප දිවයින පුරා වසා පැවති දෙමළ කොටි ත්‍රස්තවාදයෙන් අප දේශය මුදවාගෙන, එම ත්‍රස්තවාදය සහමුලින්ම පරාජය කොට ශ්‍රීලංකාව එකසේසත් වීමේ ප්‍රීතිය නිමිත්තෙනි.

ශ්‍රී රාහුල මාහිමියන්ගේ ගුත්තිල කාව්‍යයේ එන පුර- වැනුම මතකයට නංවමින් ගැහැණු, පිරිමි, බාල, තරුණ, මහළු කොයි කවුරුත් කොළඹ පුරවරයේත් අනෙක් නගරයන්හීත් වීදියක් වීදියක් පාසා සැණකෙළි පැවැත්වූහ. තැනක කිරිබත් පිසූහ. තව තැනක රබන් වැයූහ. ගීයෙන් නැටුමෙන් රඟ සොබාව උත්සන්න වීය. නිවහල් සිතුවිලි, දේශානුරාගය, ජාතික මමත්වය උතුරා ගලා ගියේය. හැම මුහුණකම දක්නට ලැබුණේ සතුටු සැනසුම් සිනා රැළිය. කෑම බීම සකසාගෙන වීදිබට ශ්‍රීලාංකිකයෝ එව, කව, බොව යන තෙපුලෙන් රැස්වූ යන එන්නන්ටද සංග්‍රහ කළෝය. මෙය දකුණට පමණක් විශේෂ වූ සිද්ධියක් නොවීය. කොටි ග්‍රහණයට හසුව තිබූ යාපනයේ දෙමළ ජනතාවද ජාතික ධජ වනමින් නගරය පුරා ප්‍රීති ඝෝෂාකරමින් වීථි සංචාරය කරනු දකිනු හැකිවීය. වෙනත් කිසිදාක නොදැල්වූ තරම් රතිඤ්ඤා ප්‍රමාණයක් මෙදා ශ්‍රීලංකාව පුරා පත්තු වූ බව ද සැබැවකි.

වෙනදා නගරයට, පාසැලට, වැඩපලට යන පවුලේ සාමාජිකයන් ආපසු ගෙදර එනතුරු විශ්වාසයක් නැත. කොහෙන් බෝම්බයක් වෙඩිල්ලක් පත්තුවේදෝයි සැක බිය නිරන්තරයෙන් පැවතුණි. ගිනි අවි අමෝරාගත් හටයන් දුටු දුටුවන් පරීක්ෂා කළේ ඒ එදා කිසිවෙකු විශ්වාස නැති බැවිනි. උතුරේ භීෂණයක් ඇතිකොට එය දකුණටද මුදා හළ ද්‍රවිඩ ත්‍රස්තවාදීන් කොතැනින් කොයි වේලේ මතුවේදැයි කිසිදු විශ්වාසය ක් නොවීය.

උතුරේ සටන් පෙරමුණු වල සිට කොළඹ රෝහල් කරා ගෙන එන තුවාල ලත් සෙබළුන්ද, ජීවිත අහිමි වූ රණවිරු මළසිරුරු ද ගෙන යන ගිලන් රථ හැල්මේ දුවන දර්ශන එවකට සුලභ වීය. පන්සලක පින්කමක්, පෙරහැරක්, පල්ලියක, කෝවිලක, පූජාවක් නිදහසේ කරගෙන යාමට ත්‍රස්තවාදීහු ඉඩ නොතැබූහ.

අද ඒ පාපතර මාරක සෙවනැලි පහව ගොස්ය. ඉතින් ඒ අපූර්ව අසිරිමත් දිනයේ සතුටු නොවන්නේ කවුරුන්ද? රජය විසින් මැයි 21 වෙනිදා නිවාඩු දින යක් කරලීමෙන් සැණකෙළි ස්වරූපය තවත් තීව්‍ර විය. සිංහළ වැසියෝ මෙවර ඉතාම ඥානාන්විතව ක්‍රියා කළෝය. අවට වෙසෙන කිසිදු දෙමළ ජාතිකයෙකුට නියපොත්තකින් කොනහන තරමේවත් හිරිහැ රයක් නොකිරීමයි. ඒ සැම දෙමළ ජාතිකයෙකුම ත්‍රස්ත වා දියෙකු නොවන බව ඔවුන් වටහාගෙන සිටින නිසාය.

දෙමළ ත්‍රස්තවාදීන් සිදුකළ අති අමානුෂික ක්‍රියාවන් සිත්සතන් වලින් බැහැර කළ නොහැකිය. අනුරාධපුර ශ්‍රීමහාබෝධිය අසල මිනිස් ඝාතනය, දළදා මාළිගාවට එල්ල කළ ප්‍රහාරය, අරන්තලාවේ භික්ෂු ඝාතනය, තන්තිරිමලේ, තිරියාය, සෝමාවතී වැනි පූජ නීය ස්ථානවලට පහරදීම, කත්තන්කුඩි මුස්ලිම් පල් ලියේ බැතිමතුන් ඝාතනයකිරීම ආදිය පිළිබඳව කිසිවිටෙකත් කොටි ත්‍රස්තයින්ට සමාව දිය නොහැකිය.

අවිගත්තන් අවියෙන්ම වැනසෙන්නා සේම කොටි ත්‍රස්තවාදීහු තමන් සිදුකළ බිහිසුණු ක්‍රියාවන්වලට තම ජීවිතවලින්ම වන්දි ගෙවූහ.. වසර 34 ක් යනු ජීවිත කාලයෙන් බාගයක් පමණ වේ. සිංහළයින් තම ජීවිතයෙන් අඩක්ම ගෙවා ඇත්තේ මරුවා සමගිනි. මරුවා පැරදවූ දින සතුටුනොවන්නේ කවුරුන්ද? සිංහළ ජාතියේ වටිනාකම රැඳී ඇත්තේ ලද ජයග්‍රහණයේ සතුට විඳීමට නිරහංකාර මාවතක් සොයාගැනීම නිසා ය.

බුදුරජාණන් වහන්සේ වැඩවිසූ සමයේ නොමළ ගෙයකින් අබ ඇටයක් සොයා ගෙන ඒමට කිසාගෝතමියට නොහැකි වූවාසේ අද උතුරේ යුද්ධය නිසා මරණයට පත් රණවිරුවෙකු මිහිදන් නොකළ සොහොන් බිමක් ශ්‍රීලංකාවේ සොයාගත නොහැකි ය.

ශ්‍රීලංකාව අත්පත් කරගත් ජයග්‍රහණය ලෝකයටම ආදර්ශමත් එකකි. යුදහමුදා විශේෂ බලකායේ ආදර්ශ පාඨය වී ඇත්තේ කළ නොහැක්කක් නොමැත යන්නය එය සැබැවින්ම අප හමුදාවෝ ඔප්පු කර ඇත්තාහ.

ලද ජයග්‍රහණය නිහතමානීව විඳ දරාගෙන එක සේසත්වූ ශ්‍රීලංකාව සමෘධිමත් දේශයක් කිරීමට ශක්තිමත්වීම අපගේ අරමුණ විය යුතු ය.

සිංහළ දෙමළ දෙපිරිස් අතර මනා සහයෝගයක් සහජීවනයක් පෙර කල වීය. උතුර දකුණ කියා වෙනසක් තිබුණේ නැත. උතුරට ගොස් බේකරි ව්‍යාපාර කළ සිංහළයෝද, දකුණට විත් සිල්ලර සුරුට්ටු වෙළඳාම කළ ද්‍රවිඩ යෝද කල්‍යාණ මිත්‍රයෝ වූහ. ආවාහ විවාහ ද නිරතුරව සිදුවිය. යාලදේවී දුම්රියෙන් යාපනයට යන සිංහළයන්ද සමුද්‍ර දේවියෙන් ගාල්ලට යන ද්‍රවිඩයන්ද එකල නිතර දක්නට ලැබුණි.

1975 වන තෙක්ම රජයේ සේවකයන් තමන්ට ලැබෙන වාර්ෂික දුම්රිය නිවාඩු බලපත්‍ර පාවිච්චි කළේ එවැනි ගමන් බිමන් වලටය. 1970 දශකයේදී යාපනය විශ්වවිද්‍යාලයේ සිංහළ අංශයක්ද පැවතුණි. මේ සියල්ල වළ දමන ලද්දේ දෙමළ කොටි ත්‍රස්තවාදය විසිනි. ඕනෑම විෂය ක්ෂෙත්‍රයක අන්තවාදයක් ඇත. අන්තවාදයේ කෙළවර ත්‍රස්තවාදයයි.

සිංහළ ජනී ජනයා එකාවන්ව සතුටු වූයේ දේශයටම ශාපයක් වූ ම්ලේච්ඡ ත්‍රස්ත වාදය නැතිකර දැමීමේ රණවිරු ජයග්‍රහ ණය නිසාය. අප කාටත් ශ්‍රී ලංකාව එකසේසත්වීමේ ජයග්‍රහණය ප්‍රීතිමත් සිතින් නිහතමානීව විඳදරා ගන්නට අප ජීවිත කාලය තුළදී ම හැකිවීම කොතරම් භාග්‍යයක්ද?

*ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු වේත්‍රධාරී*

**මේජර් වී. බී. කරුණාරත්න**

**Oxford UK**

Duke's Court Travel
DUKE'S COURT TRAVEL
Fly to Colombo
SriLankan Airlines fr £330 + Taxes
Qatar Airways fr £225 + Taxes
Kuwait Airways fr £250 + Taxes
Emirates fr £325 + Taxes
Kingfisher Airlines fr £300 + Taxes
Note: All fares mentioned are low season / terms & conditions apply.
www.easy-flights.tv
020 8748 3535 / 0800 112 0535
AITO IATA
204 King Street, London W6 0RA

ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න
FAST CASH
SEND TODAY - COLLECT TODAY
* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය
Transfer Fees From only £5
June Offer! FREE Money Transfer for You + Friend
www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT
COMMERCIAL BANK BOC HNB HSBC සම්පත් බැංකුව SampathBank PEOPLE'S BANK Standard Chartered
MCG Mike Cooke Group දින 7ම විවෘතයි

